මහාචාර්ය ආනන්ද අබේසිරිවර්ධන මහතා

මහාචාර්ය ආනන්ද අබේසිරිවර්ධන

ආචාර්ය නිමල් මල්ලවාරච්චි

කැලණිය විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු වූ ද, මානවශාස්ත්‍ර පීඨාධිපතිවරයකු වූ ද සිංහල ශබ්දකෝෂයේ වර්තමාන ප්‍රධාන කර්තා ධුරය හොබවන සම්මාන මහාචාර්ය ආනන්ද අබේසිරිවර්ධනයන්ගේ ජීවන තොරතුරු සහ එතුමන්ගේ අධ්‍යාපනික හා ශාස්ත්‍රීය සේවාවන්ගෙන් බිඳක් දැක්වීම මෙම ලිපියේ අරමුණයි.

ඓතිහාසික රෝහණ පුරවරයේ මාතර දිස්ත්‍රික්කයේ ඌරුගමුවේ බෝදරකන්ද නම් ග්‍රාමයේ දී වර්ෂ 1938 ක් වූ නොවැම්බර් මස 28 වෙනි දින, සිංඤෝ අප්පුහාමි අබේසිරිවර්ධන මහතාණන්ට සහ පුංචිහාමි අබේසිරිවර්ධන මැතිණියට දාව ජන්ම ලාභය ලැබූ මෙතුමා ආනන්ද අබේසිරිවර්ධන නමින් හැඳින්වූහ.

බෝදරකන්ද බෞද්ධ මිශ්‍ර පාසලින් ප්‍රාථමික අධ්‍යාපනය ද රදම්පොල ජ්‍යෙෂ්ඨ මිශ්‍ර පාසලින් ද්විතීයික අධ්‍යාපනය ද ලැබූ ආනන්ද අබේසිරිවර්ධනයන් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අධ්‍යයන කටයුතු කරන ලද්දේ ගාල්ලේ විද්‍යාලෝක විශ්වවිද්‍යාල පිරිවෙන් විද්‍යායතනයෙනි. ප්‍රාචීන භාෂා ශාස්ත්‍ර අධ්‍යාපනයට අයත් පාලි හා සංස්කෘත විෂයන් කෙරෙහි විශේෂ නැඹුරුවක් දැක්වීමට ද ඒ නිසා ම සිංහල භාෂාව හා සාහිත්‍යය ගැඹුරින් අධ්‍යයනය කිරීමට ද අවකාශ සැලසෙනුයේ මෙම අධ්‍යාපනික පසුබිම තුළ ය.

වර්ෂ 1964 දී විශ්වවිද්‍යාල ප්‍රවේශ විභාගයෙන් උසස් සාමර්ථ්‍යයක් ලබා පේරාදෙණිය විශ්වවිද්‍යාලයට ඇතුළත් වී 1968 වර්ෂයේ දී සිංහල විශේෂවේදී ගෞරව උපාධිය, ඉහළ සාමර්ථ්‍යයක් සහිතව ලැබූ මෙතුමා අනුවිෂය ධාරා ලෙසට තෝරාගනු ලැබුයේ පාලි හා සංස්කෘත භාෂාධ්‍යයනයයි. ශාස්ත්‍රයෙහි ලොල් වූ තරුණ ආනන්ද අබේසිරිවර්ධනයෝ උසස් අධ්‍යයන කටයුතු එයින් නිමා නොකොට 1971 දී පර්යේෂණාත්මක ශාස්ත්‍රීය නිබන්ධයක් ඉදිරිපත්